අක්‍රිය කාලය ඉවත්වීම සඳහා සති 8-10 පමණ කාලයක් ගබඩා කර ලබා ගත් නිරෝගී මධ්‍යම ප්‍රමාණයේ බල්බිකා හෝ සති 6 ක් පමණ වයස් වූ හොඳින් වර්ධනය වූ බීජ පැළ සිටුවීම සඳහා යොදාගත යුතුයි.

**බල්බ ප්‍රතිකාර කිරීම**

සිටුවීමට පෙර බල්බිකා විනාඩි 30 ක් පමණ නිර්දේශිත දිලීරනාශක ද්‍රාවණයක ගිල්වා තබා සිටුවීමට ගත යුතුයි.

* *මේ සඳහා තයෝපනේට් මීතයිල් 50% සහ තිරාම් 30% ග්‍රෑම් 2ක් ජලය ලීටර් 1 ක දිය කරගන්න.*

**පරතරය**

බල්බිකා සඳහා සෙ.මී. 10 x 10 හෝ
සෙ.මී. 8 x 8 බීජ පැළ සඳහා සෙ.මී. 8 x 8

* *බීජ බල්බිකාවල ඉහළ කෙළවර යන්තමින් පෙනෙන සේද බීජ පැළවල බල්බ කොටස පසට යට වනසේද සිටුවන්න.*

**ජල සම්පාදනය**

ඉතා හොඳින් ජලය බැස යන ඉඩමක වගාකර ඇති නම් පැළ සිටුවා පළමු මාසයේදී දින 2-3 ට වරක් ජලය සපයන්න. මසකට පසු සෑම දින 4-5 කට වරක් බැගින් ජලය සපයන්න. වැලි සහිත පසක සිටුවා ඇත්නම් ජලය සැපයීම නවත්වන්න.



**වල් මර්ධනය**

වාණිජමය වගාවක වල් පැලෑටි අතින් නෙලීම අපහසුය. එම නිසා වල්නාශක භාවිතා කිරීමට සිදුවේ.

වගාබිමේ ඇටවරා, කලාදුරු වැනි භගත කොටස් සහිත වල් පැල තිබේ නම් පැළ සිටුවීමට දින 14 කට පෙර ග්ලයිපොසේට් වල් නාශකයෙන් හෙක්ටයාරයකට ලීටර් 4-6 ක් (අක්කරයකට මිලි ලීටර් 1600-2400 ක්) යොදන්න. පැළ සිටවූ වහාම ඇලක්ලෝර් හෝ ඔක්සිෆලුවොර්ෆෙන් පූර්ව නිර්ගමන වල් නාශකයත් යෙදිය යුතුය.

**අස්වනු නෙලීම**

වගාව පරිනත වී 50% ක් පමණ පැළවල ගෙල කඩා වැටුණු පසු ලෑල්ලක් ආධාරයෙන් ඉතිරි පැළවලද ගෙල ප්‍රදේශයෙන් කඩා දමන්න. සති දෙකක් පමණ ගිය පසු අස්වනු නෙලාගන්න. මේවා මද පවනේ වියළීමට ඉඩ හරින්න.

*වැඩි විස්තර සඳහා:*
අධ්‍යක්ෂ,
ක්ෂේත්‍ර භෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය,
මහඉලුප්පල්ලම
දුරකතනඃ 025 - 2249177
025 - 2249132

Designed by: AUDIO VISUAL CENTRE, Department of Agriculture, Peradeniya.
Printed by: AGRICULTURE PRESS, Gannoruwa.

අපි වවමු - රට නඟමු

දේශීය ආහාර නිෂ්පාදනය දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුම 2007-2010

# රතුළූණු වගාව



කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.

## දේශගුණික අවශ්‍යතා

වියළි දේශගුණික තත්වයකට හොඳින් අනුවර්තනය වී ඇති රතුළූණු භෝගය මුහුදු මට්ටමේ සිට මීටර් 2000 ක් පමණ උස් වූ ප්‍රදේශ දක්වා වගා කළ හැකිය.

## පස

වඩාත් සුදුසු වන්නේ කාබනික ද්‍රව්‍ය අඩංගු වැලි ලෝම පසකි.

## බිම් සකස් කිරීම

වගාව සඳහා බිම් සැකසීමේදී එහි ඇති වල් පැළ හා ගල් බොරළු ආදිය ඉවත්කර සෙ.මී. 20 ක් පමණ ගැඹුරට පස බුරුල් වන සේ සකස් කර ගන්න. ජලය ප්‍රමාණවත් පරිදි රඳවා ගැනීම මෙන්ම වැඩි ජලය ඉවත් කර ගැනීම පිළිබඳව අවධානය යොමු කරන්න. මේ අනුව ගිල් වූ පාත්ති හෝ උස් පාත්ති පිළියෙල කර ගත හැකිය.

## වගාවට සුදුසු කාලය

යල කන්නයේ අහස් දියෙන් වගා කරන්නේ නම් මාර්තු සිට අප්‍රේල් දක්වාද, ජල සම්පාදනය යටතේ මැයි සිට ජූලි මැද දක්වා ද වගාව ආරම්භ කළ හැකිය. මහ කන්නයේ දී අහස් දියෙන් වගා කරන විට ඔක්තෝම්බර් මැද සිට දෙසැම්බර් මැද දක්වාද, ජල සම්පාදනය යටතේ දෙසැම්බර් මැද සිට ජනවාරි මැද දක්වා කාලය තුළද සිටුවීම කළ හැක. අස්වනු නෙලන අවස්ථාවේදී වියළි කාලගුණයක් ලැබෙන ලෙස වගාව ස්ථාපිත කරන්න.

## බීජ අවශ්‍යතාවය

හෙක්ටයාරයක් වගා කිරීමට අවශ්‍ය බීජ පැළ හෝ වියළි බල්බ ලබා ගැනීම සඳහා බීජ කි.ග්‍රෑම් 7 1/2 - 8 1/2 ක් අවශ්‍ය වේ.

විශාල බල්බිකා (වේදාලන්) සිටුවන්නේ නම් හෙක්ටයාරයට කි. ග්‍රෑම් 1750ක් ද, කුඩා බල්බිකා (යාපන දේශීය) හෙක්ටයාරයට කි. ග්‍රෑම් 1200ක් ද අවශ්‍ය වේ.

## නිර්දේශිත ප්‍රභේද

| ප්‍රභේදය | දින ගණන |
|---|---|
| වේදාලන් | 80 - 90 |
| වෙල්ලාරේ | 80 - 90 |
| යාපන දේශීය | 80 - 90 |



වේදාලන් වර්ගය



යාපන දේශීය වර්ගය

## මූලික පොහොර යෙදීම - හෙක්ටයාරයක් සඳහා

| අවස්ථාව | පොහොර | ප්‍රමාණය (කි.ග්‍රෑම්) |
|---|---|---|
| පැල සිටුවීමට දින 1 හෝ 2 කට පෙර | යූරියා | 65 |
| | ට්‍රිපල් සුපර් පොස්පේට් | 100 |
| | මියුරියේට් ඔෆ් පොටෑෂ් | 50 |
| **මතුපිට පොහොර** | | |
| සිටුවා සති 3 දී | යූරියා | 65 |
| සිටුවා සති 6 දී | යූරියා | 65 |
| | මියුරියේට් ඔෆ් පොටෑෂ් | 35 |

## කල්පිටිය ප්‍රදේශය සඳහා - හෙක්ටයාරයක් සඳහා

| අවස්ථාව | පොහොර | ප්‍රමාණය (කි.ග්‍රෑම්) |
|---|---|---|
| පැල සිටුවීමට දින 1 හෝ 2 කට පෙර | ඇමෝනියම් සල්ෆේට් | 150 |
| | ට්‍රිපල් සුපර් පොස්පේට් | 100 |
| | මියුරියේට් ඔෆ් පොටෑෂ් | 50 |
| **මතුපිට පොහොර** | | |
| සිටුවා සති 3 දී | යූරියා | 65 |
| සිටුවා සති 6 දී | යූරියා | 65 |
| | මියුරියේට් ඔෆ් පොටෑෂ් | 25 |

## සිටුවීම සහ පරතරය

ආකාර 2 කි.

01. බල්බිකා සිටුවීම
02. බීජ මඟින් ලබාගත් පැළ සිටුවීම